2020.05.08

# අප පරිහරණය කරන දෑ

## භාණ්ඩ හා සේවා විකුණා ගැන්ම සඳහා වෙළෙන්දන් හා නිෂ්පාදකයින් දරන විවිධ උපක්‍රම

එකම මාදිලියේ භාණ්ඩයක් විකිණීම සඳහා වෙළඳපොළ තුළ තරගයක් ඇත.මේ සඳහා ඔවුන් විවිධ ප්‍රචාරක මාධ්‍ය යොදාගනී.




ඉහත මාධ්‍ය හරහා බොහෝ දෙනාගේ සිත් ඇද ගන්නා ආකාරයට වෙළඳ දැන්වීම් ප්‍රචාරය අද තරගකාරී ලෙස පවතී .මෙහිදී විවිධ උපක්‍රම යොදාගනී .

❖විශාල ලෙස මිල අඩු කිරීම
❖එකක් ගත් විට එකක් නොමිලේ ලබා දීම
❖අමතර තෑගි ලබාදීම
❖ආකර්ශනීය ප්‍රචාරණය
❖තරගකාරී ලෙස දිනුම් ඇදීම්







මෙලෙස සකසන ලද දැන්වීම් ප්‍රචාරය කරන්නේ එකී මාධ්‍ය ආයතන වල මුදල් ඉපයීමේ අරමුණෙනි.එබැවින් ක්ෂණික ලාභය , ආකර්ශනීය පෙනුම ආදිය දුටු පමණින් මෙකී ප්‍රචාරණ දැන්වීම් වලට නොරැවටී බුද්ධිමත්ව භාණ්ඩ මිලදී ගැනීමට අපි කටයුතු කළයුතු වෙමු.

බොහෝ අනුකරණ වෙළඳ භාණ්ඩ නියමිත ප්‍රමිතියෙන් හා ගුණාත්මක භාවයෙන් නොමැත.ව්‍යාජ අනුකරණ වලින් යුතු භාණ්ඩ හා සේවා වෙළඳපොළේ ඇත්නම් ඒ බව **පාරිභෝගික අධිකාරිය** ට දැන්වීමට පාරිභෝගික අපට අයිතියක් ඇත.

(එවන් අවස්ථා පිළිබඳ වැඩිහිටියන් හා සාකච්ඡා කරන්න)

සැකසුම : සන්ධ්‍යා සමරසිංහ මිය